# උපා-ස්වර්ණා ඇගයුම්
## රුක්මණී ගී සරණියේදී.......




**මව් රටින් බැහැරව වෙනත් රටකට සංක්‍රමණය වීම අප හට පමණක් සීමා වූව ක් නොවේ. එවන් සංක්‍රමණිකයන් නව ජීවන රටාවන්ට හුරු වීමට යත්න දරනා අතරේ ඇතැමෙක් තමන් මව් රටේ සිට ලෙයට කැටි කොට ගෙන ආ සංස්කෘතික උරුමයන් නව පරිසරයේ ස්ථාපිත කිරීමට ප්‍රයත්න දරති. දෙවැණි මව් රටේ සංස්කෘතිය ණිර්මාණය වන්නේ එවැන්නන්ගේ දායකත්වය ඇතිවය.**

අපගේ මව් බිමෙන් ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ ප්‍රජාවගේ පූජා කටයුතු, උරුමයන්, වෙනුවෙන් දීර්ඝ කාලයක් තිස්සේ දායකත්වය දුන් ප්‍රජා හිතකාමියෙකු පිළිබඳවයි ඉහත පූර්විකාව. ඒ අප කවුරුත් "උපා" නමින් හඳුන්වන "උපා උපදාස" ජ්‍යෙෂ්ඨ වැඩිහිටි හිතවතායි.

"වේවර්ලි වැඩිහිටි සංගමය" විසින් සංවිධානය කෙරෙන "රුක්මණී ගී සරණිය" ගී ප්‍රසංගයේ එක් අංගයක් වන්නේ උපා උපදාස සහ ස්වර්ණා උපදාස යුවල දිගු කලක් තිස්සේ කළ ප්‍රජා මෙහෙවර අගැයුමට ලක් කිරීමයි. 2018 ජූණි 29 දින "හෙලන් වේවර්ලි කමියුණිටි සෙන්ටර් (Glen Waverley Community Center) ශාලාවේදී ප.ව. 7.30 ට පැවැත්වෙන ප්‍රසංගය රසික ප්‍රේක්ෂකයින්ගේ ද දායකත්වයෙන් රුක්මණී දේවියගේ ගීතවලින් රසවත් වන අතරේ ම මේ මහඟු කර්තව්‍යයට ද ඉඩ හසර සළස්වා ගණියි.

වසර 1977 දී ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ උපා උපදාස මානව හිතවාදියාණන්ට සිය දොළ සංසිදුවා ගැණිමට පරිසරය තනා දුන් සහෘදයේ පිරිසක්ම වූහ. සිංහල සංස්කෘතික හා ප්‍රජා සේවා පදනම (Sinhala Cultural and Community Services Foundation) ශ්‍රී ලංකාවේ සාමය ඒකීය බව හා මිණිස් අයිතිවාසිකම් සුරැකීමේ සංගමය (Society for Pease Unity and Human Rights for Sri Lanka - SPUR) ශ්‍රී ලංකා තාක්ෂණික සහ ප්‍රජා සේවා සංවර්ධන (Sri Lanka Study Center for Advancement and Technology and Social Welfare - SCATS) සංගමය ඩැංඩිනොංහි "සුපර්" සිංහ සමාජය (Super Lions Club) වේවර්හි ජ්‍යෙෂ්ඨ පුරවැසි සමාජය (Waverley Senior Citizens Club) සහ 3''' ගුවන් විදුලියේ සිංහල අංශය මේ පිරිස උපා උපදාසයන් වෙත ළං කරවූ ප්‍රධාන ප්‍රජා සංවිධාන විය.

ශ්‍රී ලංකා සංස්කෘතික පදනමේ උප සභාපති වරයා ලෙස 3''' ප්‍රජා ගුවන් විදුලිය ස්ථාපිත කරවීමෙහිලා පුරෝගාමී මෙහෙවරක යෙදුන උපා උපදාසයන්ගේ හඬ එම නාලිකාව තුළින් ගුවන් ගත වූ මුල්ම හඬ විය. ඒ 1989 ජූණි 18 වෙණිදායි. එදින පටන් වසර 10ක් තිස්සේ සිංහල වැඩසටහන්වලට දායක වෙමින් වසර 1994 1999 දක්වා නිශ්පාදකවරයකු සහ වැඩ සටහන් ඉදිරිපත් කරන්නනකු වශයෙන්ද 1994 වසරේදී එහි කළමණාකාරීත්වයට දායක වෙමින් අධ්‍යක්ෂ වරයකු වශයෙන් ද අවස්ථා කිහිපයකදීම සමායෝජකවරයා වශයෙන්ද අප ප්‍රජාව වෙනුවෙන් උපා උපදාසයන් කළ කැපවීම ඉතා අගනේය. මෙහිදී අප ප්‍රජාවේ දෙවන පරපුර වෙනුවෙන් දැක් වූ වැඩි අවධානය ණිසාම තරුණ දෙමව්පියෝද ගුවන් විදුලි වැඩසටහන්වලට වඩාත් ළං වූහ.

1994 සිට ශ්‍රී ලංකා තාක්ෂණික සහ ප්‍රජා සේවා සංවර්ධන සංගමය නැතහොත් " ස්කැට්ස් " සවිධානයේ සාමාජිකත්වය දරන උපා උපදාස ප්‍රජා ණියාමකවරයා 2005 සිට 2017 දක්වා කාලයේ සංවිධානය කළ කෙටි නාට්‍ය උළෙල කිහිපයක් අරමුදල් රැස් කරගැණිම සඳහා දියත් කළ "සයිට් ෆස්ට්" (Sight First) වැඩසටහන්, 2010 දී සංවිධානය කළ කෙටි චිත්‍රපට උළෙලත්, ඔහුගේ සිහින සැබෑ කළ සාර්ථක ව්‍යාපෘති විය. කෙටි නාට්‍යය උළෙල සය වතාවක් පැවැත්විණ. කෙටි චිත්‍රපට උළෙල වෙනුවෙන් ණිර්මාණ සයක්ම ණිශ්පාදනය විය. සිංහ සමාජය සමඟ කළ "සයිට් ෆස්ට්" ව්‍යාපෘතියෙන් ඩොලර් 25000 ක අරමුදලක් රැස්වින. මේ උපා උපදාසයන් ස්කැට්ස් සංගමයේ සභාපතිත්වයේ සිටි කාලයට පමණක් සීමාවූ සද්කාර්යයක් නොවේ. 1983 වසරේ ශ්‍රී ලංකාවේ සාමය ඒකීය බව හා මිණිස් අයිතිවාසිකම් සුරැකීමේ සංගමය හෙවත් "ස්පර්" (SPUR) සංවිධානයේද ප්‍රධාන සාමාජිකත්වය දරමින් උපා උපදාසයන් සිංහල හා දෙමළ ජනයා අතර සහයෝගීතාවය නැංවීමටද වෙර දැරීය.

විදුලි ආලෝකකරණයට සහ ශබ්ද පරිපාලනයට දැක්වූ සුවිශේෂී හැකියාවන් සහ උනන්දුව ණිසාම නොයෙකුත් සංස්කෘතිකාංග සංවිධානය කිරීමෙහි ලා උපා උපදාස තාක්ෂණික ඥාණයන් කළ කැපවීම අදටත් හීනවී නැති සේය. "හුණු වටයේ කතාව", "මහාසාර", "දහ අට සන්ණිය" වැණි අංග සංවිධානයේදී දුන් උරදීම සැබවින් කිසිවෙකුට නොදෙවෙණි විය. ප්‍රවීණ සිතාර් වාදක ප්‍රදීප් රත්නායකයන් සහ තබ්ලා වාද්‍ය විශාරද විජේරත්න රණතුංගයන් ජාත්‍යන්තර කීර්තියට පත් බටහිර වාද්‍ය වෘන්දයත් සමඟ මුසු කරමින් ඉදිරිපත් වූ "ප්‍රදීපාංජලී" ප්‍රසංගයත්, මෙල්බන් දරු දැරියන්ගේ වාද නවලට අනුව ගීත දෙකක් ගැයීමට ආචාර්ය වික්ටර් රත්නායකන් යොමු කරවා ගණිමින් කළ "ස" ප්‍රසංගයත් මෙල්බන් රසික ප්‍රේක්ෂකයන්ට නැවුම්, නොමැකෙන මතකයක් එක්කරවීය. මේ ප්‍රසංගවල ණියාමකයින් අතර උපා උපදාසයන් කැපී පෙණිණ.

වසර 2006 දී සෙරන්ඩිබ් පුවත්පත් සමාගමෙන් වසරේ හොඳම ස්වේච්ඡා සේවකයා ලෙසත්, 2007 දී 3''' ගුවන් විදුලියේ පුරෝගාමී මෙහෙවර සඳහාත්, 2008 දී ශ්‍රී ලංකා ඕස්ට්‍රේලියා චැරිටබල් හෙල්ත් ෆන්ඩ් (CharitAble Health Fund) ආයතනයෙන් හොඳම සංවිධායකයා ලෙසත් 2009 වසරේදී 3''' ගුවන් විදුලියේ පුරෝගාමී මෙහෙවර සඳහාත්, 2010 දී ස්කැට්ස් සවිධානයේ විශිෂ්ඨතාව සඳහාත්, 2011 දී වික්ටෝරියානු බහු සංස්කෘතික කොමිසමේත් (Victorian Multicultural Commission) ප්‍රජා සේවා සඳහාත් 2017 දී සර් ජෝන් මොනෑෂ් (Sir John Monash) සම්මානය ධනාත්මක වැඩිහිටි නායකත්වය සඳහාත් ලබමින් උපා උපදාසයන් ඇගයීමට ලක්විය.

මව්බිමේ දකුණු පළාතේ වල්පොල ග්‍රාමයේ දරුවන් සත්දෙනෙකුගෙන් යුත් පවුලක වැඩිමල් දරුවා ලෙස උපන් උපදාස උඩුමලගේ, අහංගම සාරිපුත්ත කණිෂ්ඨ කතළුව මහා විද්‍යාලයේත්, තෙලිජ්ජවිල මධ්‍ය මහා විද්‍යාලයේත් ආදි ශිෂ්‍යයෙකි.

වසර 1963 ශ්‍රී ලංකා මහ බැංකුවේ පරිගණක වැඩසටහන් සැළසුම්කරුවෙකු ලෙස සේවයට බැඳුන උපදාස තරුණයාට බලංගොඩ ප්‍රදේශයේ උපන් ස්වර්ණා මෙනවිය මුණගැසෙන්නේ එකම සේවක මණ්ඩලයකදී. දරුවන් පස් දෙනෙකුගෙන් යුත් පවුලක උපන් ස්වර්ණාට සොහොයුරෝ දෙදෙනෙක් සහ සොයුරියෝ දෙදෙනෙකු වෙති. තෝලංගමුව මධ්‍ය මහා විද්‍යාලයේත්, පන්ණිපිටිය ධර්මපාල විද්‍යාලයේත් ආදිශිෂ්‍යාවක වන ස්වර්ණා ඇයගේ මුල් උපාධිය කොළඹ විශ්ව විද්‍යාලයෙන් ලබාගත්තාය. පුස්ථකාල විද්‍යාව හා තොරතුරු තාක්ෂණය පිළිබඳව උපාධි ඇය ලබා ගත්තේ සංක්‍රමණය වූ පසු මෙල්බන් නුවරදී. ඇය ටේෆ් (TAFE) විද්‍යාලවල පුස්ථකාලයාධිපතිණියක සේ සේවය කළාය.

උපා ස්වර්ණා දෙපළ ණිරතුරුවම එක්ව කටයුතු කරන යුවලක් සේ අපගේ මුළු මහත් ප්‍රජාවටම ආදර්ශයක් ගෙනදෙති. උපා උපදාසයන් දිනූ යමක් වේද ඒ සියළු ජයග්‍රහනවල පංගුකාරියක වන්නට ඇයට වෙනත් කිසිදු අමතර කැප කිරීමක් අවශ්‍ය නොවේ. එසේ වී නම් ඒ ඔවුනගේ දියණියන් දෙදෙනා හදා වඩා අද මුණුපුරු මිණිපිරියන් ද බලා කියා ගන්නා ආදර්ශමත් වණිතාවකගේ අමතර කැප කිරීමයි. එය උපා උපදාසයන්ට මහඟු අත්වැලක් වී ඇති බව නො අනුමානයි.



**සිසිර දිසානායක**



# කවියෝ කියන වග

සුර සැප සිහින මාළිග සිත නැත මැවුනේ
කරදර සියලූ බාදක මැද දිවි ගෙවුනේ
සරතැස විදුලි පංකා යට නැත නිවුනේ
මුර දේවතාවිය ඔබ නිවසෙහි මවුනේ

**වෙත්තසිංහ**

